GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 99955
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

25-09-2012

## මාධ්‍ය නිවේදනයයි

ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියට හා ජ්‍යෙෂ්ඨ විධායක ශ්‍රේණිවලට අයත් වන වෛද්‍ය නිලධාරීන්, ඉංජිනේරුවරුන්, රාජ්‍ය පරිපාලනයේ ඉහල නිලධාරීන්, නීති නිලධාරීන් සහ විනිශ්චයකාරවරුන් වැනි කාණ්ඩ වලට 2010-09-01 චක්‍රලේඛනය මඟින් දුරකථන දීමනාවක් නිර්දේශ කර ඇත. එය පැහැදිලිව විධායක ශ්‍රේණි වලට අයත් නිලධාරීන්හට ඔවුන්ගේ අධ්‍යාපනික, වෘත්තීමය සුදුසුකම් වලට, රාජකාරීමය අවශ්‍යතාවයන් හා වගවීම් වලට අනුව නිකුත් කරන ලද චක්‍රලේඛණයකි. නමුත් විධායක ශ්‍රේණියට අයත් නොවන රජයේ ලියාපදිංචි හා සහකාර වෛද්‍ය නිලධාරීන් මේ වන විට එම දීමනාව ඉල්ලමින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට සම්බන්ධ වී ඇත. මෙම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයට රජයේ වෛද්‍ය නිලධාරීන් කිසිම අන්දමකින් සම්බන්ධ වී නැති අතර විධායක ශ්‍රේණියට අයත් වරප්‍රසාද හා දීමනා අනෙකුත් පහල ශ්‍රේණි වලට ලබා දීමෙන් රාජ්‍ය සේවය තුල අර්බදකාරී තත්වයක් පැන නැගෙනු ඇති බව අප සංගමයේ විශ්වාසයයි.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තවදුරටත් විධායක ශ්‍රේණි වලට නියමිත අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින අතර රාජ්‍ය පරිපාලන පටිපාටිය උල්ලංඝනය වන ආකාරයෙන් සිදුවන ඕනෑම ක්‍රියා මාර්ගයකට එරෙහිව දැඩි විරෝධතාවයක් ප්‍රකාශ කර සිටී. එවැනි යම් කිසි අන්දමක බලපෑමක් ඒ සඳහා එල්ල වුවහොත් අප සංගමය ඒ සඳහා දැඩි වෘත්තීය සමිති ක්‍රමවේදයක් අනුගමනය කරන බවද අවධාරණය කර සිටිමු.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩි විස්තර -

වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942
වෛද්‍ය නවීන් සොයිසා : 0718582444